# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2000 අංක 54 දරන ලංකා බැංකු (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කලේ 2000 අගෝස්තු මස 18 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2000 අගෝස්තු මස 18 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 5.75 යි. තැපැල් ගාස්තුව : රු. 3.50 යි.

**2000 අංක 54 දරන ලංකා බැංකු (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2000 අගෝස්තු මස 18 වැනි දින]

එල්.ඩී.–ඕ. 9/99.

**ලංකා බැංකු ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

**1.** මේ පනත 2000 අංක 54 දරන ලංකා බැංකු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *(ලුහුඩු නාමය.)*

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (397 වන අධිකාරය වූ) ලංකා බැංකු ආඥාපනතේ 7 වන වගන්තිය එහි (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :– *(397 වන අධිකාරයේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.)*

"(1) බැංකුවේ බලයලත් ප්‍රාග්ධනය එක් එක් කොටස රුපියල් දහස බැගින් වූ කොටස් මිලියන පණහකට බෙදන ලද රුපියල් බිලියන පණහක් විය යුතු ය.".

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :– *(ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම.)*

(1) "17 වන වගන්තියෙහි හෝ 19 වන වගන්තියෙහි සඳහන් පරිදි ක්‍රියා කළ හැකි ය ;" යන වචන වෙනුවට "17 වන වගන්තියෙහි හෝ 17අ වගන්තියෙහි හෝ 19 වන වගන්තියෙහි සඳහන් පරිදි ක්‍රියා කළ හැකි ය ;" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) "17 වන වගන්තියට අනුකූලව ක්‍රියා කර ඇති විටක" යන වචන වෙනුවට "17 වන වගන්තියට හෝ 17අ වගන්තියට අනුකූලව ක්‍රියා කර ඇති විටක" යන වචන ආදේශ කිරීමෙන්.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් වගන්තිය ආදේශ කරනු ලැබේ :– *(ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.)*

*("නිශ්චල දේපළෙහි සන්තකය භාර ගැනීමට කළමනාකරුහට බලය පැවරීම.)*

17. යම් ණයක්, අයිරා අණකරයක්, අත්තිකාරමක් හෝ වෙනත් අනුග්‍රහ මුදලක් සම්බන්ධයෙන් ගෙවීම පැහැර හැරීමක් කර ඇති විටක, ඒ ණය, අයිරා අණකරය, අත්තිකාරම හෝ වෙනත් අනුග්‍රහ මුදල

සඳහා ඇප වශයෙන් බැංකුව වෙත උකස් කර ඇති යම් නිශ්චල දේපළකට ඇතුළුවී එහි සන්තකය ලබා ගැනීමට සහ ඒ දේපළ පාලනය කිරීමට හා නඩත්තු කිරීමට ද, උකස්කරු විසින් ගෙවීම පැහැර හරිනු නොලැබුයේ නම් ඒ උකස්කරු විසින් ඒ දේපළෙහි පාලනය හා කළමනාකරණය සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරනු ලැබිය හැකිව තිබුණු බලතල එසේම ක්‍රියාත්මක කිරීමට ද බලය, 20 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, ලිඛිතව වාර්තා ගත කළ යුතු යෝජනාවක් සම්මත කර ගැනීමෙන් මණ්ඩලය විසින්, ඒ යෝජනාවේ නිශ්චිතව සඳහන් තැනැත්තකු වෙත පැවරිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 17අ වන වගන්තිය ඇතුළත් කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියෙහි 17අ වන වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :-

"චංචල දේපළ තහනමට අල්ලා ගැනීම සඳහා තැනැත්තකුට බලය පැවරීම.

17අ. යම් ණයක්, අයිරා අණකරයක්, අත්තිකාරමක් හෝ වෙනත් අනුග්‍රහ මුදලක් සම්බන්ධයෙන් ගෙවීම පැහැර හැරීමක් කර ඇති විටෙක ඒ ණය, අයිරා අණකරය, අත්තිකාරම, හෝ වෙනත් අනුග්‍රහ මුදල සඳහා ඇප වශයෙන් බැංකුව වෙත උකස් කර ඇති යම් චංචල දේපළක් තහනමට අල්ලා ගැනීමට බලය 20 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව ලිඛිතව වාර්තා ගත කළ යුතු යෝජනාවක් සම්මත කර ගැනීමෙන් මණ්ඩලය විසින් ඒ යෝජනාවේ නිශ්චිතව සඳහන් තැනැත්තකු වෙත පැවරිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය, එහි "පැවරිය හැකි ය" යන වචන වෙනුවට "පැවරිය හැකි අතර, ඉන්පසු ණය ගැනුම්කරු විසින් හෝ, එකී දේපළ බැංකුවට උකස් කරනු ලැබූ දිනයෙන් පසුව කරන ලද හෝ ලියාපදිංචි කරන ලද ඒ දේපළට හෝ ඒ දේපළ පිළිබඳව ණය ගැණුම්කරුට ඇති අයිතිවාසිකම්, හිමිකම් හෝ සම්බන්ධතා පිළිබඳ වූ කවර ආකාරයේ වූ හෝ බැහැර කිරීමක් මගින් හෝ එවැන්නක් යටතේ හෝ හිමිකම්පාන කවර තැනැත්තකු විසින් හෝ වුව ද කවර කරුණු නිසා හෝ එම යෝජනා සම්මතය හෝ විකිණීම අවලංගු කරන ලෙස යම් අධිකරණයක් වෙත ඉල්ලීමක් කිරීම නීත්‍යානුකූල නොවන අතර කිසිම අධිකරණයක් විසින් එවැනි ඉල්ලීමක් භාරගනු නොලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :- ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ "17 වන වගන්තියේ සහ 19 වන වගන්තියේ විධිවිධාන අදාළ වන්නේ ය." යන වචන සහ ඉලක්කම් වෙනුවට "17 වන, 17අ වන සහ 19 වන වගන්තිවල විධිවිධාන අදාළ වන්නේ ය. ;" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :-

"(2) (අ) (i) ණයකරු මියගොස් ඇත්තා වූ ද ;

(ii) ඔහුගේ මරණින් පසු මාස තුනක් ඇතුළත ඔහුගේ මරණය පිළිබඳව ලියවිල්ලකින් බැංකුවට දැනුම් දී ඇත්තා වූ ද ; සහ

(iii) ඔහුගේ අන්තිම කැමති පත්‍රය පිළිබඳ ප්‍රොබේට් බලපත්‍රය හෝ ඔහුගේ බූදලය අද්මිනිස්ත්‍රාසි කිරීමේ බලපත්‍රය නිකුත් කර නොමැත්තා වූ ද

අවස්ථාවක දී,

බැංකුව විසින් ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබූ විට, සහ අධිකරණය විසින් නියම කරනු ලැබිය හැකි කිසිවකු සිටිත් නම් ඔවුන් වෙත ඒ ඉල්ලීම් පිළිබඳ දැන්වීම භාර දී මෙන් පසු, ප්‍රොබේට් බලපත්‍රය ප්‍රදානය කිරීම හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය නිකුත් කිරීම අනිසි ලෙස ප්‍රමාද වීමට ඉඩ ඇතැයි අධිකරණය සෑහීමට පත් වුවහොත් කොළඹ දිසා අධිකරණය විසින් හෝ ඒ දේපළ පිහිටි හෝ තබා ඇති දිස්ත්‍රික්කයේ දිසා අධිකරණය විසින්, මේ වගන්තියේ කාර්ය සඳහා ඒ ණයකරුගේ බූදලය නියෝජනය කිරීමට කෙනෙකු පත් කරනු ලැබිය හැකි ය.

(ආ) ණය ගැණුම්කරු මියගොස් ඇත්තා වූ සහ ඔහුගේ මරණයෙන් මාස තුනක් ඇතුළත ඔහුගේ මරණය පිළිබඳ ලිඛිතව බැංකුවට දැනුම් දී ඇති අවස්ථාවක දී, මේ වගන්තිය යටතේ ඔහුගේ බූදලය නියෝජනය කිරීම සඳහා තැනැත්තකු පත්කරනු ලැබුවහොත් සහ පත්කරනු ලබන තුරු, මණ්ඩලය විසින් 17 වන වගන්තියේ හෝ 17අ වන වගන්තියේ හෝ 19 වන වගන්තියේ සඳහන් පරිදි ක්‍රියා නොකළ යුතු ය.".

*ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.*

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"උකස් කළ දේපළ විකිණීම සඳහා මණ්ඩලයේ යෝජනාව පිළිබඳ දැන්වීම.

21. යම් දේපළක් විකිණීමට බලය පවරමින් 19 වන වගන්තිය යටතේ සම්මත කර ගනු ලබන සෑම යෝජනාවක් ම පිළිබඳ දැන්වීම ගැසට් පත්‍රයට අමතරව පිළිවෙළින් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් පළකරනු ලබන දිනපතා පුවත්පත් තුනක, පළකරනු ලැබිය යුතු අතර, ඒ දැන්වීමේ පිටපත් ණයකරු විසින් බැංකුවට සපයන ලද ලිපිනයට ණයකරු වෙත, ලියාපදිංචි තැපෑලෙන් යවනු ලැබිය යුතු ය.".

*ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.*

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය, ඒ වගන්තියේ (අ) ඡේදය ඉවත් කොට, ඒ වෙනුවට පහත සඳහන් ඡේදය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(අ) ණයකරු විසින් බැංකුවට සපයා ඇති ලිපිනයට ණයකරු වෙත ලියාපදිංචි තැපෑලෙන් යවනු ලැබිය යුතු ය ; ".

*ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම.*

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තියේ " දිසා අධිකරණය වෙත හෝ මණ්ඩලය විසින් ගෙවිය යුතු ය." යන වචන වෙනුවට "දිසා අධිකරණය වෙත හෝ මණ්ඩලය විසින් ගෙවිය යුතු ය :

එසේ වුව ද, බැංකුව විසින් ණයගැනුම්කරුට දී ඇත්තා වූ වෙන යම් ණයක්, අයිරා අණකරයක්, අත්තිකාරමක් හෝ වෙනත් අනුග්‍රහ මුදලක් සම්බන්ධයෙන් ණය ගැනුම්කරු විසින් ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවක දී ණය ගැණුම්කරුට හෝ ණය

ගැණුම්කරුට ලැබිය යුතු ගෙවීම් භාර ගැනීමට නීත්‍යානුකූලව හිමිකම් ඇති යම් තැනැත්තකුට හෝ ඒ මුදල ගෙවීම වෙනුවට හෝ ඉහත කී පරිදි අධිකරණයේ තැන්පත් කිරීම වෙනුවට, එකී වෙනත් ණයක්, අයිරා අණකරයක්, අත්තිකාරමක් හෝ අනුග්‍රහ මුදලක් සඳහා ඇප වශයෙන් උකස් කළ දේපළ පිහිටා ඇති හෝ තබා ඇති දිස්ත්‍රික්කයේ දිසා අධිකරණයේ එකී ඉතිරි මුදල මණ්ඩලය විසින් තැන්පත් කළ යුතු ය.'' යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

11. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.